පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. — 517

ෆැක්ස් / தொலைநகல் / Fax No. — 011- 2329500

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

Website: www.police.lk

ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail — Policemedia@police.lk

මගේ අංකය / எனது இல. / My No. — PMD/PR/109/20

ඔබේ අංකය / உமது இல. / Your No. —

දිනය / திகதி / Date — 2020.06.05 පැය 1700

**ප්‍රවෘත්ති අධ්‍යක්ෂ / කර්තෘ,**
**මහත්මයාණනි / මහත්මියණි,**

## අළුත්ගම පොලිස් වසමේ මාර්ග බාධකයක දී සිදු වූ සිද්ධියක් සම්බන්ධව පොලිස්පති තුමාගේ නියමයෙන් විමර්ශනයක් ඇරඹේ.

2020.05.25 වන දින අලුත්ගම පොලිස් වසමේ අඹගහ හන්දිය ඉන්ධන පිරවුම්හල අසලදී සවස 04.45 ට පමණ දර්ගානගරය දෙස සිට වැලිපැන්න දෙසට පොලිස් මාර්ග බාධකයක් හරහා මුව ආවරණ නොමැතිව පා පැදියකින් ගමන් කල පුද්ගලයෙකු නැවැත්වීම සඳහා පොලිසිය විසින් සංඥා කර ඇත.

එහිදී එම පුද්ගලයා පොලිස් අණ නොතකා වැලිපැන්න දෙසට ගමන් කර ඇත. නැවත සුළු වේලාවකට පසු මොහු එම මාර්ග බාධකය හරහාම දර්ගා නගරය දෙසට නොනවත්වා ගමන් කිරීමට යාමේදී පොලිසිය විසින් පා පැදිය අල්ලා ඔහු නැවැත්වීමට උත්සහ කළ අවස්ථාවේදී පා පැදිකරුට පා පැදිය පාලනය කර ගැනීමට නොහැකිවී ගොස් මාර්ගය අසල තිබූ මාළු ලැල්ලක ගැටී බිම වැටී ඇත.

එම අවස්ථාවේදී මෙම පා පැදිකරු ඉතා උස් හඬින්කෑ ගසමින් පැන දුවන්නට උත්සහ කර ඇති අතර එහිදී පොලිසිය විසින් ඔහු පාලනය කර මෙල්ල කර ගැනීමට කටයුතු කර ඇත. පසුව එම ස්ථානයට පැමිණි වෙනත් පුද්ගලයෙකු විසින් මෙම පා පැදිකරු මන්ද මානසික අයෙකු බවත් ඔහුගේ පියා සෙන්ට්‍රල් පාර, දර්ගා නගරය ලිපිනයේ පදිංචිව සිටින බවටත් දැනුම් දී ඇත.

ඒ අනුව පොලිසිය විසින් පාපැදිකරුගේ පියා මාර්ග බාධකය අසලට කැඳවා ගෙනවිත් පා පැදිකරු සමග අලුත්ගම පොලිස් ස්ථානය වෙත රැගෙන යාමට ක්‍රියා කර ඇත. එහිදී පියා විසින් පොලිසිය වෙත ප්‍රකාශ කර ඇත්තේ මෙම පාපැදිකරු මානසික රෝගයකින් පෙළෙන බවත් ඇඳිරි නීති කාලය තුල තමාට කිසිඳු දැනුම්දීමකින් තොරව නිවසින් පිටව ගොස් ඇති බවයි. එහිදී පොලිසිය විසින් මේ සම්බන්ධයෙන් පියාගේ ප්‍රකාශයක් සටහන් කර ගැනීමෙන් අනතුරුව මෙම ළමයා පියාට භාරදිමට කටයුතු කර ඇත.

පොලිස් නිලධාරින් විසින් මුල් අවස්ථාවේදී හොඳින් හැදී වැඩී ඇති මෙම පා පැදිකරු මානසික රෝගියෙකු බවට හඳුනාගෙන නොමැති අතර මත්ද්‍රව්‍ය භාවිතා කර ඇති පුද්ගලයෙකු බවට සැක මතුවී ඇත. නමුත් ඉහත පරිදි මෙම ළමයා සම්බන්ධයෙන් පියාගෙන් අනාවරණය කරගත් කරුණු අනුව රඳවා තබාගැනීමක් හෝ අධිකරණ ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව මෙසේ මෙම ළමයාව පියා වෙත භාරදීමට කටයුතු කර ඇත.

පොලිස් නිලධාරීන් විසින් මෙම පා පැදිකරු මෙල්ලකර ගැනීමට අවශ්‍ය බලය පාවිච්චි කිරිමක් කර ඇති අතර පහරදිමක් සිදු කර ඇති බව මෙතෙක් අනාවරණය වී නොමැත. මෙම සිද්ධිය සම්බන්ධයෙන් බාහිර පාර්ශවයන් විසින් සමාජ මාධ්‍ය ජාලා හා විද්‍යුත් මාධ්‍ය ජාලා මගින් විවිධ ප්‍රචාරයන් ලබාදීමටද කටයුතු කර ඇති බවටත් නිරීක්ෂණනය වී ඇත.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් නියොජ්‍ය පොලිස්පති කළුතර දිසාවගේ හා කළුතර කොට්ඨාසභාර පොලිස් අධිකාරීවරයාගේ අධීක්ෂණය යටතේ එම අවස්ථාවේ රාජකාරි යෙදි සිටි පොලිස් නිලධාරින් වෙතින් යම් රාජකාරි පැහැර හැරිමක් සිදුව ඇත්දැයි යන්න පරීක්ෂා කිරිම සඳහා අභ්‍යන්තර විමර්ශණයක් ආරම්භ කර ඇත. මේ වන විට ළමයාගේ පියාගේ ප්‍රකාශ සටහන් කර සිද්ධියට භාජනය වූ වයස අවුරුදු 16 ක් වූ ළමයා කළුතර නාගොඩ රෝහලේ අධිකරණ වෛද්‍ය නිලධාරි වරයාට හා මානසික වෛද්‍ය නිලධාරී වරයාට ඉදිරිපත් කර ඇති අතර මෙතෙක් ඒ සම්බන්ධ වෛද්‍ය වාර්ථාව ලබා දී නොමැත.

එසේම මෙම සිද්ධිය සම්බන්ධව පොලිස්පතිතුමාගේ නියමයෙන් කොළඹ ළමා හා කාන්තා කාර්යාංශයේ පොලිස් අධිකාරිවරයාගේ අධීක්ෂණය යටතේ එම කාර්යාංශයේ නිලධාරී කණ්ඩායමක් විසින් විශේෂ විමර්ශණයක් ආරම්භ කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය,**
**පොලිස් මූලස්ථානය,**
**කොළඹ 01.**
(nimk)